## 388 සුවඳ සැවැන්දන

සුවඳ සැවැන්දන කුංකුම චන්දන ඇ හැම සුවඳ තෙලා
කුරුඳු කඩා ගෙන සුවඳ ලාටු ගෙන මුසු කොට සුවඳ පලා

පට පිළි ඇතිරිලි දමමින් සුදු වැලි කුඩු කළ කපුරු හලා
මුතුකුඩ ඇරගෙන ඔබ කැඳවා එමු හඬවා මිහිරි නලා

හේවිසි ගැට බෙර උඩැක්කි ඩෝලැකි මගුල් රබන් ගස්වා
ලක්දිව වෙරළම වටකොට පොඩි මැටි පහන් පෙළක් දිස්වා

ඔබ සරසන්නට පොරි හා මුසු කොට අහසින් තරු වස්වා
මංගල තාලෙට අපි ඔබ අන්දමු රන්කෙඳි සළු මස්වා